**රේගු දෙපාර්තමේන්තුවේ රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අරමුදල - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රේගු දෙපාර්තමේන්තුවේ රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් සහ වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා අරමුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍යා ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු තොරතුරු තාක්ෂණ ගාස්තු ආදායම් රු.1,248,000 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණි. | මාසිකව ලැබිය යුතු මුදල රු. 1,248,000 වන අතර වාර්ෂිකව එවැනි වාරික 12 ක මුදල වන රු.14,976,000 ක් ගිණුමේ නිවැරදිව දක්වා ඇත. | ලැබිය යුතු ආදායම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු බව. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට තොරතුරු තාක්ෂණ ගාස්තු අරමුදලේ රු.8,736,000 ක වගකීම් රු.7,488,000 ක් වශයෙන් දැක්වීම නිසා එය රු.1,248,000 න් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂයට අදාලව ලැබිය යුතු උපචිත ගාස්තුව වන රු.2,496,000 සමඟ ආරම්භක ශේෂය වන රු. 4,992,000 ක මුදලෙහි එකතුව වන රු. 7,488,000 වේ. ඒ අනුව අදාල වටිනාකම් නිවැරදිව ගිණුම්වල දක්වා ඇත. | වගකීම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු බව. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී අතිකාල රු. 862,061,573 ක් ද ,නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු රු.121,696,955 ක් ද , තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන ගාස්තු රු.11,980,800 ක් ද වශයෙන් එකතුව රු.995,739,328ක් | 995,739,328 | ඇඟිලි සලකුණු යන්ත්‍ර සටහන් වාර්තා | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009 අනුව නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම, ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් සනාථ කළ යුතු | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු බව |

| | | |
|---|---|---|
| නිලධාරීන්ට ගෙවා තිබුණ ද, එකී වියදම් තහවුරු කිරීමේ සාක්ෂි වන සේවයට වාර්තා කළ බව සනාථ කෙරෙන ඇඟිලි සළකුණු යන්ත්‍ර සටහන් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වුවත්, රේගු දෙපාර්තමේන්තුවේ කාර්ය ස්වභාවය අනුව එය ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකව දුෂ්කර වී ඇත. එබැවින්, දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා පොදු 18 ආකෘති පත්‍රය අනුව විධිමත් පරිදි අත්සන් ලේඛනයක් පවත්වා ගෙන යනු ලබන අතර, නිවාඩු ලේඛන සහ රේගු අතිකාල සඳහා වෙනම විධිමත් ලේඛනයක් ද පවත්වාගෙන යනු ලබන බවත් ඒ සඳහා මාණ්ඩලික නිලධාරියකු විසින් අනුමැතිය ලබා දීමෙන් සහ නිසි සනාථ කිරීමකින් පසු අදාල ගෙවීම් සිදු කර ඇති බැවින්, විගණන මතය හා එකඟ නොවෙමි. | |

## 1.6 ලැබිය යුතු මුදල්

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිශය** |
|---|---|---|
| අතිකාල අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණයගැති ශේෂය රු.67,546,519 ක් වූ අතර ඉන් වසර 5 කට වඩා පැරණි ණයගැති ශේෂය රු.260,180 ක් ද, වසර 1 සිට වසර 4 ක් දක්වා පැරණි ණය ශේෂ එකතුව රු.5,127,283ක් ද විය. මේ අතර රු. මිලියන 1 සිට රු. මිලියන 1.8ක් දක්වා හිඟ හිටි ගුවන් සමාගම් 5 ක් ද, නැව් සමාගම් / ගුදම් 9 ක් ද විය. එම හිඟ ශේෂයන් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | ලැබී නොමැති ශේෂ අයකර ගැනීම සඳහා එම මුදල් ගෙවන ලෙස දන්වමින් අදාළ ආයතන වෙත ලිඛිතව ලිපි නිකුත් කිරීම, හිඟ මුදල ගෙවන තෙක් ලියාපදිංචි අංක නිකුත් කිරීම නතර කිරීම, හිඟ මුදල් ගෙවන තෙක් වාර්ෂික බැඳුම්කර යාවත්කාලීන නොකිරීම ආදී කටයුතු සිදු කර ඇත. | හිඟ ණය ගැති ශේෂ අයකර ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතු බව. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)2007 ඔක්තෝබර් 26 දිනැති අංක 17/1520 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය | නැව් බඩු පරීක්ෂණ ගාස්තු ගිණුමෙන් රේගු නිලධාරීන්ට ගෙවීම් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලැබූ පටිපාටියක් පැවතිය යුතු වුව ද, එවැනි කාර්ය පරිපාටියක් අනුමත කරගෙන නොතිබුණි. | තවදුරටත් ගොනු පරිශීලනය කිරීමෙන් අනතුරුව මේ පිළිබඳව සොයා බැලීමට සටහන් කර ගතිමි. | අති විශේෂ ගැසට් පත්‍රයට අනුකූල විය යුතු බව. |
| (ආ) 2013 මාර්තු 01 දිනැති අංක 855 දරන දෙපාර්තමේන්තු නියෝගය සහ 2018 ඔක්තොබර් 01දිනැති අංක 1274 දරන දෙපාර්තමේන්තු නියෝගය | නියෝග අංක 855 මගින් 2004 වර්ෂයේදී අනුමත කරන ලද පැයක අතිකාල රේටය සියයට 45න් වැඩිකිරීමටත්, 2018 වර්ෂයේදී නියෝග අංක 1274 මගින් එවකට ගෙවූ පැයක අතිකාල රේටය සියයට 50න් වැඩිකිරීමටත් අතිකාල කමිටුවේ අවසාන නිර්දේශයට යටත්ව අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර තිබුණ ද, මෙම නියෝගයන් දෙක සඳහා අතිකාල කමිටුවේ අවසාන නිර්දේශයන් ලද බවට හෝ මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලද බවට විගණනයට තහවුරු නොවුණි. | රේගු දෙපාර්තමේන්තුව මගින් රැස්කරන දැනට පවතින ගාස්තු, අය කිරීම් හා අතිකාල ප්‍රමාණයන් (රේටයන්) සංශෝධනය කිරීම සඳහා ගාස්තු හා අයකිරීම් අනුකමිටුව හා අතිකාල කමිටුවේ නිර්දේශ අනුව ගැසට් පත්‍රයක් පිළියෙළ කර මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. | මුදල් අමාත්‍යාංශයේ සහ අතිකාල කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 123,832,043 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 181,029,338ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 57,197,295 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අතිකාල ගෙවීම් රු. 76,811,047 න් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1967 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී ආයතන 65 ක් විසින් ශ්‍රී ලංකා රේගුවේ තැන්පත් කර තිබූ රු. 220,418 ක මුදල සාමාන්‍ය ඉතුරුම් තැන්පත් ගිණුම්වල යෙදවීම | මෙහි සඳහන් ආයතන 65 ට අදාල මුදල් රේගු දෙපාර්තමේන්තුව නමින් තැන්පත්ව නොමැති අතර, ඒ ඒ ආයතන නමින් ගිණුම්ගත කර ආරක්ෂිතයක් ලෙස අදාල ගිණුම් පොත් | තවදුරටත් සේවා සැපයීම, දෙපාර්තමේන්තුව සමග ඇති බැඳියාව ආදිය පිළිබඳව |

| | | |
|---|---|---|
| තුළින් පසුගිය වර්ෂය අවසාන දිනට රු.13,062,659 ක පොළී මුදලක් උපයා තිබුණු අතර එම වසර අවසාන දිනට ආයෝජන ගිණුමේ මුලු වටිනාකම රු.13,283,077 ක් විය. කෙසේවුවද, සමාලෝචිත වර්ෂයේදී එම ආයතනවල පැවැත්ම, තවදුරටත් සේවා සැපයීම, දෙපාර්තමේන්තුව සමග ඇති බැදියාව ආදිය පිළිබඳව කිසිදු විමර්ශනයක් සිදු නොකර අදාල ශේෂ ගිණුම්වලින් ඉවත් කර තිබුණි. | රේගු දෙපාර්තමේන්තුව භාරයේ තබාගෙන ඇත. කෙසේ වෙතත් වැරදීමකින් අදාල බැංකු ගිණුම් 65 හි ශේෂයන් (පොළිය සමඟ) රේගු දෙපාර්තමේන්තු ගිණුම් වලට ඇතුළත් කර ඇත. එසේ සිදුකර ඇති වැරදි ගිණුම් ගත කිරීම සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කිරීම නිසා මෙම තත්ත්වය ඇති වී තිබේ. | විමර්ශනයක් සිදු කර අදාල ශේෂ ගිණුම්වලින් ඉවත් කල යුතු බව. |
| (ආ) 2019 වර්ෂයේ සිට අතිකාල අරමුදලේ ආදායම ඉක්ම වූ වියදමක් දක්නට ලැබුණු අතර එම ඌණතාවය වාර්ෂිකව ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂ 5ක කාලසීමාව තුළ රේගු අතිකාල ආදායම ඉක්මවූ එකතු වියදම රු.638,933,884 ක් වූ අතර ආදායම ඉක්මවූ වියදම පියවා ගැනීමට සමුච්චිත අරමුදල් යොදා ගැනීම මත 2019 වර්ෂයේ සිට සමුච්චිත අරමුදලේ ශේෂය ක්‍රමයෙන් පිරිහෙමින් පැවතුණි. ඒ අනුව 2019 වර්ෂයේදී රු.2,275,913,245 ක්ව පැවති සමුච්චිත අරමුදලේ ශේෂය 2023 දෙසැම්බර් 31 දින වන විට රු. 1,636,979,362 ක් දක්වා රු.638,933,884 කින් අඩුවී තිබුණි. රැස්කරන ලද අතිකාල ආදායමට වඩා ගෙවීම් සිදුකිරීම මෙයට හේතු වී තිබුණු නමුත් එයට ප්‍රමාණවත් හේතු සොයා බැලීමක් කළමනාකරණය විසින් සිදුකර නොතිබුණි. | වරින්වර නිකුත් කරනු ලබන රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව 2007.10.26 දිනැති හා 1520/17 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය හා එහි සංශෝධන ප්‍රකාරව යාවත්කාලීන නොවූ ගාස්තු ප්‍රමාණයන් අය කිරීම හේතුවෙන් රැස් කළ අතිකාල ගාස්තුව අඩු වී ඇත. රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සංනිවේදන අරමුදල යටතේ ආදායම් රැස් කිරීම සම්බන්ධයෙන් නැවත සලකා බලා යාවත්කාලීන කිරීම සඳහා ගාස්තු අයකිරීම් කමිටුවක් පත්කර ඇති අතර, එම කමිටු නිර්දේශ මත ඉදිරියේදී ඉහත රේටයන් යාවත්කාලීන කර අතිකාල අරමුදලේ ආදායම ඉහළ දැමීමට කටයුතු කරමින් සිටී. | රැස්කළ අතිකාල ආදායම ඉක්මවා ගෙවීම් නොකල යුතු බව. |
| (ඇ) නිලධාරීන් සාමාන්‍ය රාජකාරි වලින් පරිබාහිරව සේවයේ යෙදුනාද යන්න තහවුරුවකින් තොරව රේගු අතිකාල අරමුදලින් සියයට 90 ක් නිලධාරීන් වෙත අතිකාල වශයෙන් ගෙවා තිබුණු අතර 2021 වර්ෂයේ සිට 2023 කාල සීමාව ඇතුළත රැස්කල මුළු අතිකාල ආදායම රු.2,516,116,911 ක් අතරින් රු.251,611,691 ක් පමණ සුළු ප්‍රමාණයක් රාජ්‍ය ආදායමට බැරකර | රේගු අතිකාල සහ නැව්බඩු ගාස්තු සම්බන්ධ 2007.10.26 දිනැති හා 1520/17 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි (4) 3 ප්‍රකාරව සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදලේ 2013.09.27 දිනැති හා 1829/39 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ (3) 5 (අ) ප්‍රකාරව නිලධාරීන්ට ගෙවන මුදල හා රජයේ ආදායමට බැර කරන මුදල සම්බන්ධයෙන් තීරණය කර ඇත. | රාජ්‍ය ආදායමට බැර වන ප්‍රමාණය පිළිබඳව නැවත සමාලෝචනයක් සිදු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| තිබුණි. ඒ අනුව රාජ්‍ය ආදායමට බැර වන ප්‍රමාණය පිළිබඳව නැවත සමාලෝචනයක් කළමනාකරණය විසින් සිදු කළ යුතුව පැවතුණි. | ඒ අනුව මෙම අරමුදලේ ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ. | |
| (ඇ)2017 පෙබරවාරි 27 දිනැති දෙපාර්තමේන්තු නියෝග අංක 1140 අනුව රේගු නැව් බඩු පරීක්ෂණ ගාස්තු ලැබීමට හිමිකම් පෑම සඳහා සතියේ දින වල පෙ.ව. 06.00 ට පෙර සහ සති අන්තයන්හිදී සහ රජයේ නිවාඩු දින වලදී පෙ.ව. 09.00 ට පෙර සේවයට වාර්තා කළ යුතු බවත්, එසේ නොමැති අවස්ථා වල පරීක්ෂණ ගාස්තු සඳහා හිමිකමක් නොමැති බවත් සඳහන් වුවද, ශ්‍රී ලංකා රේගුවෙහි කාර්යය මණ්ඩලය පැමිණීම/ පිටවීම පවත්නා චක්‍රලේඛ වලට අනුව තහවුරු කර ගැනීමකින් තොරව 2012 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු. 3,334,759,284 ක් පරීක්ෂණ ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009 අනුව නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම, ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් සනාථ කළ යුතු වුවත්, රේගු දෙපාර්තමේන්තුවේ කාර්ය ස්වභාවය අනුව එය ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකව දුෂ්කර වී ඇත. එබැවින්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා පොදු 18 ආකෘති පත්‍රය අනුව විධිමත් පරිදි අත්සන් ලේඛනයක් පවත්වා ගෙන යනු ලබන අතර, නිවාඩු ලේඛන සහ රේගු අතිකාල සඳහා වෙනම විධිමත් ලේඛනයක් ද පවත්වාගෙන යනු ලබන බවත් ඒ සඳහා මාණ්ඩලික නිලධාරියකු විසින් අනුමැතිය ලබා දීමෙන් සහ නිසි සනාථ කිරීමකින් පසු අතිකාල ගෙවීම් සිදු කර බැවින්, විගණන මතය හා එකඟ නොවෙමි. | පැමිණීම/ පිටවීම තහවුරු කර ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු බව. |

## 3.2 මෙහෙයුම් අකායර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අරමුදලට අයකරගන්නා ලද ආදායම අතිකාල, නැව්බඩු පරීක්ෂණ හා තොරතුරු තාක්ෂණ කටයුතු වෙනුවෙන් පිළිවෙලින් රු.820,263,153 ක්, රු.243,393,910 ක් හා රු.14,976,000 ක් වී තිබුණි. එම කාර්යයන්ගේ කටයුතුවල නිරත වූ නිලධාරීන්ට අතිකාල ආදායමෙන් සියයට 105 ක් ලෙස රු.862,061,573 ක් ද, නැව්බඩු පරීක්ෂණ ආදායමෙන් සියයට 50 ක් ලෙස රු.121,696,955ක් ද හා තොරතුරු තාක්ෂණ ආදායමෙන් සියයට 80 ක් ලෙස රු.11,980,800 ක්ද ගෙවා තිබුණි. ඉහත ගෙවීම් ක්‍රියාවලිය තුළ පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |

| | | |
|---|---|---|
| (i) අතිකාල අරමුදලේ ගෙවීම් විධිමත් පාලනයක් යටතේ සිදු නොවන බව ඉකුත් විගණන වාර්තාවල අඛණ්ඩව පෙන්වා දී තිබුණද, මෙම තත්ත්වය විධිමත් කිරීම සඳහා මේ දක්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉකුත් විගණන වාර්තාවල පෙන්වා දී ඇති කරුණු ද විශ්ලේෂණය කරමින් ගෙවීම් ක්‍රමවේදය තවදුරටත් විධිමත් කිරීමට කටයුතු කරමින් පවතී. | වර්තමාන අතිකාල ගෙවීම් ක්‍රියාවලිය සමාලෝචනය කළ යුතු බව. |
| (ii) 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය තුළ අතිකාල ආදායම රු.21,217,698 කින් අඩුවී තිබුණි. තවද, වර්ෂය තුළ දී රැස් කළ අතිකාල ආදායම ඉක්මවා රු.41,798,420 ක් අතිකාල වියදම් ලෙස නිලධාරීන්ට ගෙවා තිබුණි. | අතිකාල අදායම අඩුවීමට හේතුව ඉහත දක්වා ඇත. කෙසේ නමුත් 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ අතිකාල වියදම ද රු. 76,811,047 කින් අඩුවී ඇත. | ආදායම් නිසි පරිදි කළමනාකරණය කළ යුතු බව. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| අතිකාල අරමුදලේ 2023 ආදායම ලෙස රු.1,053,337,500 ක් ඇස්තමේන්තු ගත කර තිබුණ ද උපයාගත් සත්‍ය ආදායම රු. 820,263,153 ක් වීම හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායමට වඩා සත්‍ය ආදායමේ රු. 233,074,347 ක අහිතකර විචලතාවයක් නිරීක්ෂණය විය. මෙය ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 22 ක පිරිහීමකි. මෙයට ප්‍රධාන හේතු වශයෙන් ‘‘කොළඹ’’ අනුශීර්ෂය යටතේ වූ ආදායම රු. 173,625,308 ක් හා “ආනයන” අනු ශීර්ෂය යටතේ වූ ආදායම රු.26,570,200 කින් අඩුවීම බලපා තිබුණි. ඒ අනුව අතිකාල අරමුදලේ අයවැය ඇස්තමේන්තුව අනුව රු.3,750 ක අතිරික්ත ආදායමක් අපේක්ෂා කළද ප්‍රතිඵලය වී තිබුණේ රු.123,832,043 ක ඌනතාවයකි. | යාවත්කාලීන නොවූ ගාස්තු ප්‍රමාණයන් අය කිරීම හේතුවෙන් රැස් කළ අතිකාල ගාස්තුව අඩු වී ඇත. මේ සම්බන්ධයෙන් නැවත සලකා බලා යාවත්කාලීන කිරීම සඳහා ගාස්තු අයකිරීම් කමිටුවක් පත්කර ඇති අතර, එම කමිටු නිර්දේශ මත ඉදිරියේදී ඉහත රේටයන් යාවත්කාලීන කර අතිකාල අරමුදලේ ආදායම ඉහළ දැමීමට කටයුතු කරමින් සිටී. | අය වැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන මෙවලමක් වශයෙන් භාවිතා කළ යුතු බව. |